**කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර.**

**දෙවන වාර ඇගයීම - 2018**

**පුරවැසි අධ්‍යාපනය I-II**

**9 ශ්‍රේණිය**

**කාලය පැය 02**

**සැලකිය යුතුයි.**

**(i) I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය බැවින් එම ප්‍රශ්නය ඇතුළත්ව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.**

## I කොටස

- ප්‍රශ්නවලට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. සමාජයේ මූලික තැනුම් ඒකකයක් ලෙස සැලකෙන්නේ,
   1. පවුල  2. පාසල  3. අගමික ආයතන  4. ගම

2. සමාජයක මූලික ලක්‍ෂණයකි.
   1. පුද්ගලයන් එකතුවී සිටීම.  2.සාමුහිකව කටයුතු කිරීම.
   3. අවශ්‍යතා ඉටු කර ගැනීම.  4.ඥාති සබඳතා පැවැත්වීම.

3. සමාජ සුරක්ෂිතතාව යනු
   1. සෑම පුද්ගලයෙකුටම සාමකාමීව ජීවත්වීමට ඇති හැකියාවයි.
   2. පුද්ගලයාට ආරක්ෂිතව ජීවත්වීමට හා කටයුතු කිරීමට සමාජයෙන් ලැබෙන පිටිවහලයි.
   3. සමාජයේ පවතින නිදහසයි.
   4. පුද්ගලයාට ඕනෑම කාර්යයක නිරතවීමට ඇති හැකියාවයි.

4. සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා පවුලෙන් ඉටුවන කාර්යයක් නම්,
   1. සාමාජිකයන් අතර යහපත් සම්බන්ධතා වර්ධනය කිරීම.
   2. විධිමත් අධ්‍යාපනයක් ලබා දීම.
   4. සමබර පෞරුෂයකින් යුත් පුද්ගලයන් බිහි කිරීම.
   5. අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීමට ඉගැන්වීම.

5. නීතිය යනුවෙන් හැඳින්වෙන්නේ
   1. සමාජයේ යහපත පිණිස රජයවිසින් පනවනු ලබන පොදු රෙගුලාසි පද්ධතියකි.
   2. අතීතයේ සිට පැවත එන දඬුවම් ලබා දෙන ක්‍රමයකි.
   3. පුද්ගලයා විසින් තමා වෙනුවෙන් පනවා ගනු ලබන හැසිරීම් රටාවකි.
   4. පොත පතේ සඳහන් වැරදි සඳහා හිමිවන දඬුවම් සමූහයකි.

6. නීතියේ ගුණාංගයක් වනුයේ
   1. සාධාරණ බව හා රජය විසින් පනවනු ලැබීම.  2. පක්ෂපාති බව
   3. ලිඛිතව සටහන් නොවීම.  4. සාම්ප්‍රදායිකව පැවත ඒම

7. ශ්‍රී ලංකාවේ අධිකරණ අතරින් ඉහළම අධිකරණය හඳුන්වන්නේ
   1. අභියාචනාධිකරණය නමිනි.  2. ශ්‍රේෂ්ඨාධිකරණය නමිනි.
   3. මහාධිකරණය නමිනි.  4. දිසා අධිකරණය නමිනි.

8. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,
   1. නීතිපති තුමා  2. අග්‍රවිනිශ්චයකාරතුමා
   3. අධිකරණ ඇමති තුමා  4. ජනාධිපතිතුමා

9. පහත දැක්වෙන ආදර්ශ පාඨ අතරින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ ආදර්ශ පාඨය කුමක්ද?
   1. ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී  2. පීතෘභූමිය සඳහා
   3. රටවට බැඳි රන් වැට  4. සුරකිමු ලකඹර

10. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ළමා හිංසනය හා අපචාර පිළිබඳව දැනුවත් කළ හැකි දුරකථන අංකය වනුයේ
   1. 1929   2. 119   3. 1919   4. 1717

11. විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටලුවක් පිළිබඳව විසඳුම් සොයා ගැනීමට කෙරෙන අධ්‍යයනය හඳුන්වනුයේ,
   1. පර්යේෂණය   2. සමීක්ෂණය   3. පරීක්ෂණය   4. ගවේෂණය

12. තාක්ෂණය වෙනස් වීම නිසා ඇති වූ අහිතකර බලපෑමක් නම්,
   1. වැඩ පහසු වීම.   2. කාලය ඉතිරි වීම.
   3. ඵලදායිතාව වැඩි විම.   4. පරිසර දූෂණය වේගවත් වීම.

13. තිරසාර සංවර්ධනයේදී ප්‍රධාන අවධානය යොමුව ඇත්තේ පහත දැක්වෙන කුමන කරුණ වෙනුවෙන්ද?
   1. සම්පත් නාස්තිය අවම කිරීම හා පරිසරය රැකගැනීම.
   2. පරිසරය රැක ගැනීම හා සම්පත් උපරිම අයුරින් භාවිතා කිරීම.
   3. මිනිසුන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කර නිෂ්පාදන කටයුතු වේගවත් කිරීම
   4. යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් නිෂ්පාදන කටයුතු සිදු කිරීම.

14. ආර්ථිකයක සිදුවන වෙනස්වීම් පිළිබඳ සලකා බැලිය හැකි ප්‍රධාන අංශ කිහිපයක් වේ. ඒවා නම්,
   1. කෘෂිකාර්මික, කාර්මික හා සේවා   2. කෘෂිකර්මික හා සේවා
   3. කාර්මික හා සේවා   4. කෘෂිකර්මික හා කාර්මික

15. වැඩ ලෝකය යනුවෙන් අදහස් කරන්නේ,
   1. සමාජයේ පවත්නා සියලුම රැකියා අවස්ථාවන්ය.
   2. රැකියා සඳහා පවතින ඉල්ලුමය.
   3. ඉහළ හා පහළ යනුවෙන් රැකියාවල පවත්නා තත්ත්වයයි.
   4. වර්තමාන ලෝකය කාර්යබහුල බවය.

16. සහජීවනය නමින් හඳුන්වන දෑ වඩාත් පැහැදිලි වන පිළිතුර තෝරන්න.
   1. එකිනෙකාට උදව් කරමින් සහයෝගයෙන් කටයුතු කිරීමයි.
   2. සිය අවශ්‍යතා ඉටු කර ගනිමින් සතුටින් ජීවත් වීමයි.
   3. උදව් අවශ්‍ය විටදී අන්‍යයන්ට උදව් උපකාර කිරීමයි.
   4. තමා අන් අයට ආදර්ශයක් වන අයුරින් ජීවත් වීමයි.

17. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පවතින ලක්ෂණ හඳුනාගත හැකි වූ පැරණි රාජ්‍යයකට උදාහරණයක් වනුයේ,
   1. ඉන්දියාව   2. ග්‍රීසිය   3. චීනය   4. බ්‍රිතාන්‍යය

18. වක්‍ර ප්‍රාජතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන නූතන රාජ්‍යවල ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ග අනුගමනය කරන අවස්ථා පවතියි. එයට උදාහරණයක් වනුයේ,
   1. ජනමත විචාරණය   2. මහා මැතිවරණය
   3. පළාත් සභා මැතිවරණය   4. ජනාධිපතිවරණය

19. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණයකි.
   1. නිදහස් ජන මාධ්‍ය පැවතීම.
   2. එක් දේශපාලන පක්ෂයක් පමණක් පැවතීම.
   3. අන් මතවලට ඉඩ ලබා නොදීම.
   4. නිදහස හා අයිතිවාසිකම් සඳහා ඉඩ ලබා නොදීම.

20. පුරවැසියෙකු සතුවූ මූලික අයිතිවාසිකමක් වනුයේ,
   1. නිදහසේ ජීවත් විම.
   2. වැඩිහිටියන්ට සැලකීම.
   3. පොදු දේපල සුරැකීම
   4. සෙසු අයගේ නිදහසට අයිතිවාසිකම්වලට ගරු කිරීම.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. i. සමාජ සුරක්ෂිතභාවය ඇති කිරීමට මුල් වන ආයතන 2 ක් ලියන්න.
  ii. තාක්ෂණය වෙනස්වීම නිසා සමාජයේ ඇති වූ වෙනස්කම් 2 ක් ලියන්න.
  iii. රැකියා පුහුණුව ලබා දෙන ආයතන 02 ක් නම් කරන්න.
  iv. වර්තමානයේ තාක්ෂණය භාවිතයට ගැනෙන අවස්ථා 2 ක් සඳහන් කරන්න.
  v. කෘෂිකර්ම අංශයට සම්බන්ධව රැකියා 02 ක් සඳහන් කරන්න.
  vi. සමූපකාරයේ ආදර්ශ පාඨය ලියන්න.
  vii. සමූපකාර ක්‍රමයේ අරමුණු 2 ක් සඳහන් කරන්න.
  viii. දේශිය ශාක 3 ක් නම් කරන්න.
  xi. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.
  x. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න.

(ලකුණු 2x10= 20)

02. i. නීතියේ ගුණාංග 02 ක් ලියන්න. (ලකුණු 02)
  ii. දේශීය නීතිය බෙදා දැක්විය හැකි කොටස් 03 කුමක්ද? (ලකුණු 03)
  iii. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ඔබ සහය විය හැකි අයුරු කරුණු 3 ක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

03. i. තාක්ෂණය යනු කුමක්ද? (ලකුණු 02)
  ii. කෘෂිකර්මාන්තයේදී නවීන තාක්ෂණය භාවිතා කරන අවස්ථා 03 ක් ලියන්න. (ලකුණු 03)
  iii. නවීන තාක්ෂණය භාවිතයට ගැනීමේ අවාසි 03 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

04. i. වත්මන් රැකියා වෙළඳපොළ සමන්විත වන අංශ 02 ක කුමක්ද? (ලකුණු 02)
  ii. නව රැකියා මාර්ගයන්හි නිරත වීම සඳහා ඔබ විසින් සපුරා ගත යුතු සුදුසුකම් 03 ක් ලියන්න. (ලකුණු 03)
  iii. රැකියා වෙළඳ පොළේ නව ප්‍රවණතාවලට අනුව බිහිව ඇති නව රැකියා 05 ක් ලියා දක්වන්න. (ලකුණු 05)

05. i. යහජීවනය යනු කුමක්ද? (ලකුණු 02)
  ii. මානව සමාජය යහපත්ව පවත්වා ගෙන යාම සඳහා ප්‍රගුණ කළ යුතු යහජීවන ගුණාංග 03 ක් ලියන්න. (ලකුණු 04)
  iii. යහජීවනයෙන් යුතුව කටයුතු නොකිරීම නිසා පුද්ගලයන්ට මුහුණ දීමට සිදුවන ප්‍රතිවිපාක 04 ක් ලියා දක්වන්න.
(ලකුණු 05)

06. i. සහජීවනය යනු කුමක්ද? (ලකුණු 02)
  ii. සහජීවන ගුණාංග 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
  iii. (A)සහජීවන ගුණාංග ජීවිතයට අදාළ කර ගැනිමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

  (B) සමුපාකර ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

07. i. ස්ථිරසාර භාවය යනු කුමක්ද? (ලකුණු 03)

ii. ස්ථිරසාර භාවය වර්ධනය කර ගැනීම සඳහා පුද්ගලයෙකු තුළ ඇති කර ගත යුතු ගුණාංග 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. පුරවැසියෙකු වශයෙන් ජාතිය ගොඩ නැගීම සඳහා ඔබට දායක විය හැකි අකාර 03 ක් දක්වා එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

08. i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන පලාත් පාලන ආයතන 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. පළාත් පාලන අයාතනවලින් ඉටුවන සේවාවන් 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. පළාත් පාලන ආයතනවලින් සේවා ඉටුකරවා ගැනීමේදී පොදු ජනතාවගෙන් ඉටුවිය යුතු යුතුකම් 05 ක් ලියන්න.
(ලකුණු 05)

09. "ලොව වෙසෙන කිසිදු පුද්ගලයෙකුට හුදකලාව ජීවත් විය නොහැකිය."

i. ඉහත කියමනට හේතු කවරේද? (ලකුණු 02)

ii. ලොව විවිධ රටවල් අන්‍යොන්‍ය රැදියාවෙන් යුතුව කටයුතු කිරීමට විවිධ සංවිධාන පිහිටුවා ගෙන ඇත. එවැනි සංවිධාන 3 ක් සඳහන් කරන්න.
(ලකුණු 03)

iii. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක හදුනා ගත හැකි ලක්ෂණ 05 ක් ලියන්න. (ලකුණු 05)